COVID-19 VACCINATION

# LET'S DO THIS – Sinhalese

NSW GOVERNMENT

# ළමුන් සඳහා (වයස 5 - 11) COVID-19 එන්නත

දැන්ම දිනයක් වෙන්කර ගන්න

## වයස අවුරුදු 5 - 11 අතර ළමුන් COVID-19 ආසාදනයට එරෙහිව ප්‍රතිශක්තිකරණය ලබා ගත යුත්තේ ඇයි?

COVID-19 යනු දරුණු අසනීප සහ මරණය මෙන්ම දීර්ඝ කාලීන සෞඛ්‍යය ගැටළු ඇතිවිය හැකි වයිරසයකි. මිනිසුන් අතර මෙය ඉතා පහසුවෙන් පැතිරිය හැකි අතර සමහර අවස්ථාවල කිසිදු රෝග ලක්ෂණයක් නොමැතිව හෝ ඉතා සුළු රෝග ලක්ෂණ ඇතිව වුවද ඔබට ආසාදනය තිබී ඔබ නොදැන වෙන අයට එය පැතිරිය හැකිය.

ළමුන් අතර COVID-19 ආසාදනය වැඩිහිටියන්ට වඩා අඩු ආකාරයට ඇති වුවද, ළමුන් හට ප්‍රතිශක්තිකරණය ලබා දීමට ඉතා ප්‍රබල හේතු ඇත:

- එන්නත් මගින් ප්‍රතිශක්තිකරණ පද්ධතියට උපකාරයක් ලබාදෙයි. ඔබගේ දරුවාට එන්නත ලබාදීම මගින් ඔවුන්ව COVID-19 ආසාදනයෙන් දරුණු ලෙස රෝගාතුවීමෙන් ආරක්ෂා කිරීමට උපකාරවේ.
- එන්නත ලබාදීම මගින් රෝගය පැතිරීම අඩු කිරීම මගින් සියළු වයස්වල ගොදුරුවිය හැකි අය ඇතුළු මිතුරු මිතුරියන්, පවුලේ උදවිය සහ ප්‍රජාව ආරක්ෂා කිරීමට උපකාරවේ.
- එන්නත ලබාදීම මගින් දරුවන් පාසැල්වල තබා ගැනීමට සහ ඔවුන්ගේ අධ්‍යාපනයට සහ වර්ධනයට වැදගත්වන සමාජ ක්‍රියකාරකම්වලට සහභාගිවීමට උපකාරවේ.

දැනටමත් ලොව පුරා මිළියන සංඛ්‍යාත දරුවන් COVID-19 ආසාදනයට එරෙහිව ආරක්ෂාකාරී ලෙස එන්නත් කර ඇත. සාක්ෂි මගින් පෙන්වා දෙන්නේ ළමුන් අතර COVID-19 ආසාදනයෙන් ඇතිවන දරුණු අසනීප සම්බන්ධයෙන් විශිෂ්ඨ ආරක්ෂාව ලබා දෙන අතර ඔබගේ පවුලේ අයව ආරක්ෂාකාරීව සහ සුවෙන් තබා ගැනීමට උපකාර වන බවයි.

## ළමුන් හට වැඩිහිටියන්ට මෙන්ම එකම එන්නත සහ මාත්‍රා ලබා දෙයිද?

**නැත.** වයස අවුරුදු 5 - 11 අතර ළමුන් හට දීමට අනුමත එන්නත වන්නේ විශේෂ ළමා එන්නතක් වන Pfizer (Comirnaty) අතර මාත්‍රා දෙක ලබා දෙන්නේ සති 8 ක කාල පරතරයක් ඇතිවය.

වයස අවුරුදු 5-11 ළමුන් හට ලබා දෙන Pfizer එන්නත් මාත්‍රාව වයස අවුරුදු 12 සහ ඊට වැඩි අයට ලබා දෙන මාත්‍රාවෙන් තුනෙන් එකක් පමණවේ. මෙම වයස් කණ්ඩායමේ සිටින අයට ලබා දෙන වඩා කුඩා මාත්‍රාව මගින් වයස අවුරුදු 12 සහ ඊට වැඩි අය හට ලබා දෙන සමාන ආකාරයේ ආරක්ෂාව ලබා දිය හැකිය.

## ළමුන් අතර ඇතිවන අතුරු ආබාධ වැඩිහිටියන් අතර ඇතිවන අතුරු ආබාධ හා සමානද?

**ඔව්.** COVID-19 එන්නත ලැබීමෙන් පසු ළමුන් විසින් වැඩිහිටියන් විසින් අත් දකින අතුරු ආබාධ අත්දැකිය හැකිය.

මෙම අතුරු ආබාධ ඉතා අඩු ඒවා වන අතර දිනකට හෝ දෙකකට පසුව නැතිව යන අතර පහත ඒවා ඇතුලත්වේ:

- හිසරදය
- උණ සහ සීතලවීම්
- තෙහෙට්ටුව / වෙහෙසකරබව
- මාංශ පේශි රුදාව සහ එන්නත ලබා දුන් ප්‍රදේශයේ අත ඉදිමුව

අඩු තරමේ අතුරු ආබාධ සාමාන්‍ය වන අතර එයින් පෙන්වන්නේ ප්‍රතිශක්තිකරණ පද්ධතිය මගින් එන්නතට ප්‍රතිචාර දක්වන බවයි. වැඩිදුර දරුණු අතුරු ආබාධ ඉතා විරළ අතර, COVID-19 ආසාදනය ඇතිවීම මගින් ඇතිවිය හැකි අතුරු ආබාධ ඇතිවීමේ අවදානම ඉතා වැඩිය. අතුරු ආබාධ දිගටම ඇති බවට ඔබට සැකයක් ඇතිනම්, ඔබගේ පවුලේ වෛද්‍යවරයාට කථා කරන්න.


© NSW Ministry of Health December 2021

## දරුණු අතුරු ආබාධයක අවදානම යනුවෙන් අදහස් වන්නේ මාගේ දරුවාට එන්නත් නොකළ යුතු බවද?

**නැත.** ඕස්ට්‍රේලියාවේ භාවිතා කරන සියළුම COVID-19 එන්නත් අනුමත කර නිර්දේශ කිරීමට පෙර ආරක්ෂාව සහතික කිරීම සඳහා චිකිත්සීය භාණ්ඩ පරිපාලනය (TGA) සහ ප්‍රතිශක්තිකරණය පිළිබඳ තාක්ෂණික උපදේශක කණ්ඩායම (ATAGI) මගින් සැලකිය යුතු ආකාරයට පරීක්ෂා කර ඇගයීම සිදු කරයි.

මේ වන විට ඇමෙරිකා එක්සත් ජනපදයේ වයස අවුරුදු 5-11 අතර ළමුන් මිළියන 5 කට අධික සංඛ්‍යාවක් සහ ලොව පුරා තවත් මිළියන සංඛ්‍යාවක් COVID-19 එන්නත ආරක්ෂාකාරී ලෙස ලබාගෙන ඇත.

## COVID-19 එන්නත මගින් මාගේ දරුවාගේ වැඩීම, වර්ධනය, හෝ අනාගත සරුභාවයට බලපෑමක් සිදුවේද?

**නැත.** COVID-19 එන්නත මගින් දරුවෙකුගේ වැඩීම හෝ වර්ධනයට බලපා හැකි කිසිවක් ඇති බවට සාක්ෂි නොමැත.

COVID-19 ආසාදනයේ දීර්ඝ කාලීන බලපෑම් හේතුවෙන් සෞඛ්‍යය සහ සුබසාධනය සම්බන්ධ දීර්ඝ කාලීන බලපෑම් ඇතිවිය හැකිය. වයිරසය ආසාදනයවීම මගින් ඇතිවිය හැකි සංකූලතාවයන් එන්නත මගින් ඇතිවිය හැකි සුළු අතුරු ආබාධවලට වඩා සාමාන්‍යයෙන් බෙහෙවින් වැඩිය.

## මාගේ දරුවා හට දැනටමත් COVID-19 ආසාදනයවී ඇතිනම් ඔවුන්ට එන්නත ලබා දිය යුතුද?

**ඔව්.** COVID-19 ආසාදනයවූ දරුවන් සිය අසනීපය සුව වීමෙන් පසු තවත් ආසාදනයකින් ආරක්ෂාවීම සඳහා එන්නත ලබා ගත යුතුය.

## මාගේ කැමැත්ත නැතිව මාගේ දරුවාට එන්නත ලබා දිය හැකිද?

**නැත.** වයස අවුරුදු 5-11 අතර ළමුන් හට COVID-19 එන්නත ලබාදීම සඳහා ඔවුන්ගේ දෙමාපිය හෝ භාරකාර කැමැත්ත ලබා දිය යුතුය.

දිනයක් වෙන් කර ගන්නා අවස්ථාවේදී සහ නැවත එන්නත ලබා ගැනීමට පැමිණි අවස්ථාවේදී කැමැත්ත අවශ්‍යවේ. එන්නත ලබා දෙන අවස්ථාවට මාපියෙකු හෝ භාරකරු හට දරුවා සමඟ පැමිණීමට නොහැකි නම්, ඔවුන් විසින් මාර්ගස්ථව කැමැත්ත සම්පූර්ණ කරන අවස්ථාවේදී ඒ සඳහා වෙනත් වැඩිහිටියෙකු නම් කළ හැකිය.

එන්නත සඳහා දිනයක් වෙන්කර ගන්නා අවස්ථාවේදී නම් කරනු ලබන වැඩිහිටියාගේ තොරතුරු ලබා දීම මගින් එන්නත ලබා දෙන දිනයේදී ඔවුන්ගේ අනන්‍යතාවය සහ කැමැත්ත ලබා දීමට ඇති හිමිකම තහවුරු කර ගත හැකිය.

කැමැත්ත සම්බන්ධ වැඩිදුර විස්තර සඳහා Vaccination consent FAQs for parents and guardians (දෙමාපියන් සහ භාරකරුවන් සඳහා එන්නත සඳහා කැමැත්ත ලබාදීම සම්බන්ධ නිතර අසන ප්‍රශ්න) වෙබ් අඩවිය වෙත පිවිසෙන්න.

## COVID-19 එන්නත ලබා ගැනීම ළමුන් සඳහා අනිවාර්යද (පැසැල් සහ ක්‍රීඩා ඇතුළුව)?

**නැත.** COVID-19 ආසාදනයට එරෙහි එන්නත අනිවාර්ය නැති මුත් ලබා ගන්නා ලෙසට ඉතාමත් උනන්දු කරයි.

ළමුන් හට පාසැල් හෝ ප්‍රජා ක්‍රීඩා ක්‍රියාකාරකම්වලට සහභාගිවීම සඳහා COVID-19 එන්නත ලබා ගැනීමේ අවශ්‍යතාවයක් නැත.

## මාගේ දරුවාට බූස්ටර් මාත්‍රාවක් ලබාගත හැකිද?

**නැත.** වඩා වයසින් අඩු අය අතර ප්‍රාථමික එන්නත් මාත්‍රා මගින් ශක්තිමත් ප්‍රතිශක්තිකරණ ප්‍රතිචාරයක් ඇති කරයි.

අනාගතයේදී මෙම වයස් කාණ්ඩයේ අය හට බූස්ටර් මාත්‍රාවක් අවශ්‍යද යන්න ATAGI මගින් සලකා බලනු ඇත.

## ළමුන්ව පාසැලේදී COVID-19 ආසාදනයට එරෙහිව එන්නත ලබාදෙයිද?

**නැත.** ඔබගේ දරුවාගේ COVID-19 එන්නත සඳහා දිනයක් වෙන්කර ගැනීම පවුලේ වෛද්‍යවරයා, පළාතේ ෆාමසිය, ඇබොරිජිනල් ප්‍රජා පාලන සෞඛ්‍යය සේවාව හෝ නිව් සවුත් වේල්ස් සෞඛ්‍යය එන්නත් සායනයක් මගින් සිදු කර ගන්න.

## මා විසින් දිනයක් වෙන්කර ගන්නේ කෙසේද?

සිය දරුවන් සඳහා හැකි විගස එන්නත් සඳහා දිනයක් වෙන්කර ගන්නා ලෙසට දෙමාපියන් උනන්දු කරනු ලැබේ.

**දැන් මාර්ගස්ථව දිනයක් වෙන් කර ගන්න** - www.nsw.gov.au/COVID-19/vaccination/get-vaccinated

**දිනයක් වෙන්කර ගැනීමට අමතන්න:** වෙන් කර ගන්නා උපකාර අංකයඃ 1800 57 11 55 / පරිවර්තන සහ තෝල්ක සේවාව (TIS) 131 450


© NSW Ministry of Health December 2021